#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina

තමන්ගේ ප්‍රවෘත්ති වාර්තාවන්ට යොදාගැනෙනා මූලාශ්‍රයන්ගේ රහස්‍ය භාවය ආරක්ෂා විය යුතු අවස්ථාවක ඒ සඳහා හැකි සෑම පියවරක්ම ගැනීමට සෑම විටම ජනමාධ්‍යවේදියෙකු ආචාර ධාර්මිකව බැඳී සිටී. එය එසේ වුවත්, එසේ මූලාශ්‍රයක රහස්‍ය භාවය ආරක්ෂා කළ යුතු අවස්ථාවක හැරෙන්නට තමන් ඉදිරිපත් කරනා ප්‍රවෘත්ති වාර්තාවන් සඳහා නිසි ලෙසින් මූලාශ්‍ර ඉදිරිපත් කිරීමද ආචාර ධාර්මික ජනමාධ්‍යකරණයක ලක්ෂණයකි. ඒ ඔස්සේ එම ප්‍රවෘත්ති වාර්තාවේ විශ්වාසනීයත්වයද ඉහළ යනු ඇත.

දිවයින පුවත්පත තුළ වන මෙම පුවත සඳහාද කිසිදු මූලාශ්‍රයක් සපයා නැත්තේ උක්ත කී ලෙසින් මූලාශ්‍රයන්ගේ රහස්‍ය භාවය ආරක්ෂා විය යුතු නිසාවෙන්ද? එසේ නොමැති නම් අදාළ පුවත සඳහා පිළිගත හැකි මූලාශ්‍රයන් නොමැති වීම ඊට හේතුවද? මෙය පාඨකයා විසින් ප්‍රශ්න කළ යුතු කරුණක් බව මෙසේ දක්වමු.